# නිර්මාණ Nirmana



## ගුණ සැමර්ම

ගුණ සමරන්නෙ මළවුන් ගුණ පිළි ගෙනය
ගුණ පිළිගැනීමෙන් දැක්වෙයි යහ ගුණය
එය වේ අරිය ධනයෙහි සද්ධා ධනය
එම ධන මළවුන්ට දිය හැකි මහ පිනය

හැමකෙකු තුළම බුදුගුණ සැඟවිලා ඇත
යහගුණ කිසිත් නැතියෙකු මේදියතේ නැත
එම ගුණ වැඩී දියුණුව ගිය දිනක සිත
පත්වේ අමා මහ නිවනට සියළු සත

කවදා හරි අපත් මැරෙනා බව කියන
පහනකි මරණේ නිවනට මහ හෙළි කරන
මොහොතක සියළු දෙය අනියත බව පෙනෙන
අපටත් දැකිය හැක අජරාමර නිවන

හැම මොහොතෙම මැරේ උපදින මොහොතෙ දිම
නොමැරී දිගට නොසිටී මෙහොතක් කිසිම
අත්හළ යුතුය මැරෙනා විට හැම දෙයම
ජීවිතයකදි එය කළ හැක හැම විටම

මරණය උපතින්ය අපහට ලැබෙන් නේ
කවුරුද උපන් පසු නොමැරී සිටින් නේ
වැලපෙන නමුදු මරණය දැක අනුන් නේ
ඒ වැලපුමෙන් මොන ඵලයද ලැබෙන් නේ

වැලපුම් හැඬුම් නවතා හිත හදා ගෙන
මරණය භාවනාවක් ලෙස වඩා ගෙන
නවතා උපත යළි මරණය ලබා දෙන
දැකියැක නිවන් සිත සදහට නිවා ගෙන

♦ **මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම**
**Harrow UK**

## දුරු රටකදී සමුගත් ගුරුමෑණි !

ද රු පරපුරක නුවණැස පහදමින් නිතින්
ගුරු මෑණියේ විදුහල්පති පදවි වෙතින්
සරු සෙනෙහසක් ලක්බිම වගුරමින් මෙතින්
දු රු බිම්කඩක සැතපුණි දෝ නිවුණු සිතින්

සි ත ඉකි බිඳියි සිහිවන කල ඔබේ ගුණ
නෙත උතුරමින් කඳුලැලි දහකරයි මන
බි ත මත සිතුවමකි ලෙන්ගතු සිත්හි දන
ව ත රැඳි සිනා රැළි මැද සැඟවුණිද පණ

සත් කුළු පව් මතින් පියඹා දුරක ගොසින්
සත් සිය දහස් මිතු අතහැර ගියෙද රොසින්
සත් මෙත් කුළුණු ගුණ සපිරුණු වුවන තොසින්
සත් සිත් පුරා දැකගන්නේ කෙලෙස නිසින්

ය ළි කිසි දිනෙක ඔබ අප හමු නොවෙනු සැබැයි
පි ළි ගත නොහේ අපතර ඔබ සිටිනු නැතැයි
දි ලි රන් පහන නිවුනෙන් ගන අඳුර පිරෙයි
වෙළි බැමි ලිහී නිවනේ සුව ලබනු තිරයි

( නොබෝදා ලන්ඩනයේ අභාවප්‍රාප්ත
ප්‍රේමා අදිකාරි මහත්මිය වෙනුවෙනි )

♦ **කැතරින් ගුණවර්ධන**
**මොරගොල්ල Sri Lanka**

## යසෝදරාවත

ජැකට්ටු හෙල්මට් සන් ග්ලාසස් ඇඳ
දඩු මොණරෙන් ආ රජ කුමරා
ගාමන්ට් එක ළඟ බස් නැවතුම් පොළ
ස්වයංවරය ලද යසෝදරා

ඉර හඳ ගෙන දෙන පොරොන්දු මැද්දේ
පතිකුල පිවිසුණු යසෝදරා
සියළු ඉසුරු පිරි රම්‍ය සුරම්‍ය වු
සිහින දකින්නී යසෝදරා

පරගන රැඟුමින් කුල්මත් හිමි දැක
ඉවසා සිටියේ යසෝදරා
වියරු දුමාරෙන් විකල් වු දැතින්
ගුටි බැට වින්දේ යසෝදරා

ලැලි මැදුර හැර ඔහු පිටවුණු සඳ
පුතු හා තනිවුණු යසෝදරා
පුතුගෙ සිනා මැද රළු හෙට දවසට
දිරිය ලබන්නී යසෝදරා

තනිකම සළුවක කරදර පොදි බැඳ
ජීවන මඟ යන යසෝදරා
නූතන සිදුහත් සසර සරන සඳ
මතු බුදුවන්නී යසෝදරා

♦ **ශ්‍රියා කුමාරසිංහ**
Dunedin - **New Zealand**

## පිබිදෙන උතුර

සෙනෙහස් වැහි පොදින් මනුසත් සිසිල පෙරා
කුලගොත් දෑ හැඟුම් එක මුතුහරක දරා
ලක් මවු සුවය දෙනවිට සිත් සතන් පුරා
යුහඳුරු ඉරයි නව හිරු රැස් පොකුරු සරා

සිඳු දළ රළ පෙළේ සිරි නෙතු ගැටෙන විට
මුදු වැලිතලා අප පායුග සිඹින විට
දහසක් අඳුරු රුදු සේයා මැකෙන විට
කිසිවෙකු තනිවෙලා නැති බව සිතේ මට

වැඳගෙන නාගදීපය මෙත් මලිනි පුදා
බලමින යාලදෙවිගෙ හැඩ සිටින විදා
මොක් සුව සිතට ආවා වැනි සතුට රදා
පිබිදෙන උතුර නොසිතමි සිහිනෙකැයි මෙදා

දිවි සාගරේ දුකඳුරු හැම නිවා ගෙන
එක කිරිබතක රස මුවගේ තබා ගෙන
දකුණින් උතුරු වෙත මුදු පෙම සදා ගෙන
නව වසරට ඇදෙමු සොම්නස දරා ගෙන

♦ **දුලාංජලී සිරිවර්ධන**
**නීති පීඨය**
**කොළඹ විශ්වවිද්‍යාලය Sri Lanka**

## බසයට පමණක් !


බසයක නැග යන්නට හන්දිය වෙත
දෙපයට වැරදී දුවන වේගයෙන්
ගිය මුත් එක තත්පරයක් අඩුවෙන්
බසය ඉගිලුණා මාව පෙනි පෙනිත්

" ගැහැණු ළමයි
පාරේ යන බස් වැනිය......
එකක් වැරදුණොත්
අනිකෙහි යා හැකිය......"

ගැහුණු ළමුන්හට හා බසයට එම
කළ උපමාවන් පෙර සිටි කවියෙකු
පිළිගත හැකි වේදැයි කිව නොහැකියි
එනමුදු මෙය කිව යුත්තකි නොවලා

දුර එන විට හුන් තැනින් නැගිටිනා
පෙර මහ ගොස් පිළිගැනෙන ෂතුටිනා
ලොව යස පැවතුම් නිබඳ වැනසෙනා
බසයට පමණකි නොනැස පවතිනා

♦ **සේපාලිකා ජයසිංහ**
**Middx UK**



## LORDS OF THE DESERT

Under the searing heat of a relentless sun
Over vast sand sheets and ever shifting dunes
Camel trains follow invisible veins
of ancient trade routes
Across Sahara's immense yellow wastes.

Early morning, near Egypt's Port Said
Black-turbaned Bedouin cameleers
Prepare a line of thirty camels
Through a punishing wilderness
They will journey for months;
some will meet their death
Doe-eyed they sit beautifully fawn coloured
Nonchalantly chewing the cud
Looking haughtily around.

♦ **Denis Jansz - London NW8**

## අරුත් සුන් පින්කම්

පින් සිත පිවිතුරුය
පව් සිත භයංකාරය
වටහා ගෙන අගය
කරනා විටදි නිසි දෙය
එයින් සැලසෙන මෙහෙය
බබලවයි මුලු ජන සමාජය

පින් පිණිස මතුවට
හරයක් නොමැති දේ කොට
පැතුවොත් අප නිවන
වැඩක් වේදැයි සැක සිතේ මට

කිරියෙන් බෝ හිමි නාවා
බෝ සමිඳුන් ලෙඩ කරවා
දහස් ගනන් කොඩි මහලා
වෙහෙර වටේ රැල් ඇඳලා
එහි හැඩ තල හංගාලා

නිවන් පතන මිනිසුන්ගේ
මනස තුලින් අප දකින්නෙ
තන්හා මෝහය නොවේද
මමත්වයේ අකාරුණික
සෙවනැල්ලේ අඳුර නොවෙද

ඒ කිරි ඒ රෙදි හරවත් දේක ට
යොදවා කුළුණෙන් හදවත් තෙත් කොට
දුප්පත් මිනිසුන් බැතියෙන් සුව කොට
දිවියේ අනියත බව තේරුම් ගෙන
සිතුවොත් සිත තුළ
මොහඳුර දුරු කොට
පින් පල පල දේ බුදු හිමි දෙසූ ලෙස

♦ **මධුරි අබේවික්‍රම**
**Harrow UK**





## ජීවිතය

හුරුබුහුටි එළියක්
දෙමින් දැල්වෙයි
ඉටිපහන
උණුවී වැගිරෙනා
ඉටි වැතිරෙයි පාමුල
නූලක කෙළවරක්
දැවී අවසන
නිමාවෙයි
නිවීයාමත් සමග

♦ **වසන්තා කුමාරි**
**දසනායක**
**කිරිඳිවැල Sri Lanka**

## මල්ලියේ ඔහොම නොකරන් !

තාත්තත් ගෙදර නැහැ එපිටහ වැඩට ගිහින්
තාප්පෙත් තැනින් තැන ගිලිහී වැටට අගින්
බාප්පත් ඉන්නෙ හුවකටත් එපිට දුරින්
මාප්පත් ගියැයි මිය පරලොව අපට හොරෙන්

කාත් කවුරුවත් හදියකදී එන්න
දැ ත් කාගෙවත් නැහැ විපතෙදි දෙන්න
තාත් තවත් හිටියා නම් මට ඔන්න
සාත් තුවක් වෙන ගානයි මා දන්න

ගෙදරම දියණියන් දීගෙට දෙන වයසේ
නිතරම හුල්ලමි මම ගෙයි දොර පියසේ
හතරම දෙනෙක් පිය මන පෙනුමට නිසිසේ
කතරම පාළු ගානයි මගෙ දිවි සිරසේ

ම ල්ලී බාලයා ඉපදී බඩ පිස්සේ
ස ල්ලී ඇති කෙනෙක් සහයට ගති විගසේ
ක ල්ලී ගැසුණු හැටි කොළු රැළ පිටි පස්සේ
බැල්ලී කමත් තව නම්බුයි ඉන් පස්සේ

ව ල් පැල වැවී සටහන් දැන් මැකු ණාට
කල් යල් බලා කැත කුණු අත ගෑ වාට
සල් ලියෙ බලය නුඹෙ හිස උඩ රැඳු නාට
ම ල් ලියෙ ඔහොම නොකරන් නුඹෙ අක්කාට!

♦ **කුමුදු රොහාන් අමරසිංහ**
**Edmonton London**

## වර්ගය නෑ එංගලන්තෙ !

**දහසක් පැතුම් මැද සතුටු සිතින්**
**ලන්ඩනයට පා තැබුවේ**
**දරුවනේ බලන්නයි නුඹලා**
**සීතලේ ගුලිවෙමින්**
**අත් පා රෙදිවලින් වසා**

**එක් උදයක දුටුවා**
**ලොකු සිහිනයක්**
**අනේ අපොයි සිතට බයයි**

**මට අතහැර යන දියණිය**
**වයසක් නෑ දහතුනයි**
**ඇගෙ සිත්ගත් කොලු පැංචා**
**පහලොවයි දුව කියයි**
**අයිපොඩ්- බ්ලූටූත්- මෙගා බයිට්**
**දියුණුලු භාෂාව. මොළයත් එහෙමයි.**
**ප්‍රශ්නයක් නෑ.**
**මා තැවුණේ**
**මගේ මුනුබුරන් අසයි ද මටගෙන්**
**දුටුගැමුණු, මහසෙන්, වළගම්බා**
**ෆේස්බුක් එකේ නැද්ද අම්මේ ?**

♦ **තිස්ස විජේසුරේන්ද්‍ර**
**මහරගම Sri Lanka**

## අම්මා සමුගෙන වසර දොළහයි

මරණයේ දොරටුවෙන්
නික්ම ගිය පසුව ඔබ
අතීතයෙ මතක පොත
ඉතිරිවිය තනිකමට
හිරු නැගෙන අළුයමේ
සඳ පහන්වන රැයේ
පාළුවත් විඩාවත්
සෝකයත් භීතියත්
දැනෙනවා ඔබ නැතුව

පිය තෙපුල් මුදු වදන්
මුවග හසරැළි සොයමි
අඳුරු සිත්තම් තුළින්
ඔබේ මරණය දකිමි
නොකියාම ගියෙ මන්ද?
මගේ තනි නොතනියට
සිටියෙ නම් ඔබ අදත්
සිනාසී කියා දෙයි
මිනිසුන්ගෙ ගති සොබා
ජීවිතයෙ රහ සොබා

පින් මහිම ඇති බැවින්
හමුවේවි මතු සසර
එනම් දම් මණ්ඩපේ
බුදු මුවින් බණ අසා
එක්ව සුවපත්වන්න
දිනෙක මා එන තුරා
මග රැඳී ඔබ ඉන්න!

♦ **පද්මා කුරුප්පු**
**Paris France**

## නික්මයාමට අවසර !

මඳ පවන් රැළි සිඹින සැලෙන බෝපත් අතර
මෙත් සිසිල දැනේ මට බවුන් වඩනෙමි නිතර
නික්ම යමි ලොව අතැර පෙර නිමිති දැක සසර
එතෙර දක්නෙමි දිනෙක මේ නිසරුබව අතැර

දෙපා ළඟ වැතිර හිඳිනා නීල වර ලසක
වත්සුනක පිහිට ලැබ දිලෙන රූසිරු වතක
අනුරාග වහසි බස් රැඳුණ දොඩමළු නෙතක
සොඳුරුබව සැඟවුණිද නිසංසල වන පෙතක

සිප වැළඳ මාපියන් දෙපා වැඳ ලැබ සමා
කසාවත් හැඳ සියළු සම්පත් ද හැර දමා
පිය තබමි නව ලොවක අතීතය කර නිමා
නිවී සැනහෙමි! නිබඳ දහම් සුවයෙන් අමා

♦ **සන්ධ්‍යානි සේනාරත්න**
**Surbiton Surrey UK**

## ස ප්‍රසංගයට පසු

දවසක් දා හැන්දෑවේ
තව සිය ගණනක් සමගින්
ශාලාවක අඩ අඳුරේ
අසුන් ගතිමි ස බලන්න

අමා දහර දිය ගලා ගලා යන
තොටුපළ අයිනේ ඉඳගෙන
බින්දුමතී ගැන හිත හිත
තනි තරුවක් දුටුවෙමි මම


අභියාචනයක් කරනට අවසර
සඳහිරු තරු පවතින තුරු
දෙව්රම් වෙහෙරේ වැඩ සිටි සමයේ
බුදුහාමුදුරුවො අපිත් දකින්නැති

මුතුවරුසාවට තෙමුනත් අපි හැම
මෝහෙන් මුලාවෙලා උන්නත් අපි
සිත මිතුරු සුළඟ ළඟ ළඟ එන බව
ආදර උල්පත වූ මව කිව් සැටි

අපි ඔක්කොම රජ වරු වගේම
අපි ඔක්කොම වැසියෝ වගේම
තුන් සිංහලයෙම
නෑදැයෝ බව සිතමින්
ශාලාවෙන් පිටවූයෙමි මම්!

♦ **මහින්ද ගමගේ**
**London N22**

## හුදකලාවේ ගීතය



ජීවිතය ගීතයක්
සොඳුරු අඩහැර ගැයෙන
හරස්පද පෙරළියක්
තව විටෙක නොවිසඳෙන
සුවඳ පිරි මල්මිටක්
මත් බිගුන් ගී ගයන
කෙළවරක් නැති මගක්
ඉසිඹුවක් හමුනොවන

ආදරය පිරි ලොවක්
සතුට උතුරාගලන
අඳුරු මහ දිය කඳක්
ගැඹුර මනිනට නොහෙන
කඳුල රැඳි සහනයක්
සිහින පුපුරා හැලෙන
ජීවිතය ගීතයක්
හුදකලාවේ වැයෙන

♦ **අචිනි කල්හාරි ලියනදුර**